ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පාඨමාලාවේ
විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව
2016
රුහුණ විශ්ව විද්‍යාලය
ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
2016 සැප් 18

දේශක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජේ. ජේ. සමන් උදය කාන්ත
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

## වැඩවසම් සමාජ ක්‍රමය

1. "වැඩවසම් ක්‍රමය යනු රජුගේ සිට පහළම මට්ටමේ ඉඩම් හිමියා දක්වා සියළු දෙනාම ඉඩම් බුක්තිය වෙනුවෙන් ඉටු කරනු වගකීම් සමුදායන් එකට බැඳී පවතින සම්පූර්ණ සමාජ සංවිධානයකි"
2. වැඩවසම් ක්‍රමය විවිධ රටවල විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වී ඇත. එහෙයින් එයට නිශ්චිත අර්ථකතනයක් දීම අපහසුය. නමුත් සෑම රටකම වාගේ ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ ඇත. ඒ අනුව වැඩවසම් ක්‍රමය යනු ඉඩම් බුක්තිය හා ඒ වෙනුවෙන් සේවා සැපයීම පදනම් කරගත් දේශපාලන සමාජ ආර්ථික මෙන්ම සංස්කෘතික සංවිධාන ක්‍රමයක් ලෙස අර්ථ දැක්විය හැක

ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය ප්‍රධාන කොටස් දෙකකි.

1 යුරෝපයේ ආර්ථික ඉතිහාසය හා

2 ශ්‍රී ලංකාවේ සමකාලීන ආර්ථික සංවර්ධනය

මධ්‍යම කාලීන යුරෝපයේ දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අභිවර්ධනය (වැඩවසම් සමාජ ක්‍රමය)

- වැඩවසම් සමාජ ක්‍රමයක් වශයෙන් අප හඳුන්වන්නේ සෑබවින් මධ්‍යම ආණ්ඩුවකින් පාලනය නොවන සමාජයකි.
- ප්‍රදේශිය වශයෙන් පාලන කටයුතු බෙදා ගනිමින් සිය පාලන බලතල ක්‍රියාවේ යෙදවීමට අනුව ජාතික රාජ්‍යයක ලක්ෂණ දක්නට ලැබුණි.
- දේශපාලන ක්‍රමයක් වශයෙන් වැඩවසම් වාද්‍ය ඉඩම් හිමියන් විසින් කෙරුණු පාලන ක්‍රමයක් වූ අතර ආර්ථික වශයෙන් ඉඩම් බුක්ති ක්‍රමයක් විය.
- ක්‍රියාවලියක් මෙය ප්‍රථමයෙන් ඇසුරු කර ගනිමින් කරුණු රැසක් තවදුරටත් හේතු වෙමින් පරිහානියට පාත්‍රවීම.

යුරෝපයේ ආර්ථික ඉතිහාසය විෂය යටතේ

1. වැඩවසම් සමාජය සහ ඒ ආශ්‍රිතව ඇතිවූ වෙනස්කම්
2. ජාතික රාජ්‍ය සහ වාණිජවාදී දර්ශනයේ වර්ධනය
3. කාර්මික විප්ලවය සහ ධනවාදයේ වර්ධනය හා සමාජ විපර්යාසය
4. ප්‍රංශ විප්ලවය
5. සමාජවාදී චින්තනය හා සෝවියට් විප්ලවය

## වැඩවසම් සමාජ ක්‍රමය

- වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ:

1. ඉඩම් හිමියා හා ප්‍රවේණිදාසයා අතර ඇති සබඳතාවය
2. පුද්ගල බද්ධ පාලන ක්‍රමය
3. ඉඩම් බුක්ති විඳීම වෙනුවට සේවය සැපයීම
4. ප්‍රාදේශිය පාලකයන් සතු පෞද්ගලික හමුදාව
5. ප්‍රවේණිදාසයා වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් රැසක් ඉඩම් හිමියා සතු වීම

## වැඩවසම් සමාජ ක්‍රමයේ ලක්ෂණ

- ආර්ථික ක්‍රමයේ ලක්ෂණ:

1. ප්‍රධාන ආදායම් මාර්ගය ඉඩම් වගා කිරීමෙන් ලැබෙන ආදායම වූ හෙයින් වැඩවසම් ක්‍රමය ඉඩම් හා බැඳුණු ආර්ථික රටාව වශයෙන් පෙන්වා දිය හැක
2. ප්‍රවේණි වගා කිරීම ප්‍රවේණි දාසයින් විසින් සිදු කළ අතර ප්‍රවේණි වල ඉඩම් තීරු ලෙස වෙන්කර දාසයන් අතර බෙදා දෙන ලදී
3. දාසයේ තමන්ට අයත් කොටසේ තමාගේ ජීවනෝපාය සැකසීම හා ඒ වෙනුවෙන් වංශාධිපතිවරයාට වෙන්වූ කොටසේ නොමිලේ සේවය කිරීම. ඒ අනුව දින තුනක් වංශාධිපති ඉඩමේ සේවය කිරීම


## වැඩවසම් සමාජ ක්‍රමයේ ලක්ෂණ

- ආර්ථික ක්‍රමයේ ලක්ෂණ:

1. ප්‍රධාන ආදායම් මාර්ගය ඉඩම් වගා කිරීමෙන් ලැබෙන ආදායම වූ හෙයින් වැඩවසම් ක්‍රමය ඉඩම් හා බැඳුණු ආර්ථික රටාව වශයෙන් පෙන්වා දිය හැක
2. ප්‍රවේණි වගා කිරීම ප්‍රවේණි දාසයින් විසින් සිදු කළ අතර ප්‍රවේණි වල ඉඩම් තීරු ලෙස වෙන්කර දාසයන් අතර බෙදා දෙන ලදී
3. දාසයේ තමන්ට අයත් කොටසේ තමාගේ ජීවනෝපාය සැකසීම හා ඒ වෙනුවෙන් වංශාධිපතිවරයාට වෙන්වූ කොටසේ නොමිලේ සේවය කිරීම. ඒ අනුව දින තුනක් වංශාධිපති ඉඩමේ සේවය කිරීම


## වැඩවසම් සමාජ ක්‍රමයේ ලක්ෂණ

- ආර්ථික ක්‍රමයේ ලක්ෂණ:

4. කට්ටි මාරු ක්‍රමය සහ ශස්‍ය මරු ක්‍රමය ඉඩම් සඳහා යොදා ගැනීම
5. ස්වයංපෝෂිත ආර්ථික රටාව තුළ සුළු වශයෙන් කර්මාන්ත තිබීම
6. වෙළඳාම ඉතා අල්ප වශයෙන් භාණ්ඩ හුවමාරුව මගින් සිදුවීම
7. ස්වයංපෝෂිත ආර්ථික රටාව නිසා නගර බිහි නොවුණු අතර නිෂ්පාදන අතිරික්තයක් ද නොවීය


## වැඩවසම් සමාජ ක්‍රමයේ ලක්ෂණ

- ආර්ථික ක්‍රමයේ ලක්ෂණ:

4. කට්ටි මාරු ක්‍රමය සහ ශස්‍ය මරු ක්‍රමය ඉඩම් සඳහා යොදා ගැනීම
5. ස්වයංපෝෂිත ආර්ථික රටාව තුළ සුළු වශයෙන් කර්මාන්ත තිබීම
6. වෙළඳාම ඉතා අල්ප වශයෙන් භාණ්ඩ හුවමාරුව මගින් සිදුවීම
7. ස්වයංපෝෂිත ආර්ථික රටාව නිසා නගර බිහි නොවුණු අතර නිෂ්පාදන අතිරික්තයක් ද නොවීය


## වැඩවසම් සමාජ ක්‍රමයේ ලක්ෂණ

- දේශපාලන ක්‍රමයේ ලක්ෂණ

1. සමාජයේ සෑම පුද්ගලයෙකුම කුමන අන්දමින් හෝ ප්‍රභූතියකු යටතට පත්වීම
2. සියළු බලතල බොහෝ දුරට විකේන්ද්‍ර වීම හා රජු වංශාධිපතිට පමණක් ප්‍රධානත්වය ඉසිලූ බලයෙන් අඩු පුද්ගලයෙකුවීම
3. රජුගේ එකම ආදායම රජුට වෙන්වූ ඉඩම් වල බදු වලින් හා වංශාධිපතියන්ගේ ප්‍රදානයන් තුළින් ලැබීම
4. රාජ්‍ය හමුදාවක් නොවූ අතර වංශාධිපති ප්‍රාදේශීය පාලකයෝ ස්වාධීනව කටයුතු කරන ලදී
5. අධිකරණ කටයුතු බොහෝ දුරට වංශාධිපති සතු විය. ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් පෞද්ගලික හමුදාවක් ක්‍රියාත්මක විය

## වැඩවසම් සමාජ ක්‍රමය

- සමාජ ක්‍රමයේ ලක්ෂණ:

1. වැඩවසම් සමාජය තුල සමාජයේ තරාතිරම මනින මිම්ම වූයේ උත්පත්තියයි
1. සමාජය ඉහළ හා පහළ වශයෙන් බෙදී තිබූ අතර ඉඩම් සාමාන්‍ය ජනතාවට හිමි නොවීම ද සුවිශේෂ ලක්ෂණයකි
2. ඉහළ සමාජය විශාල වශයෙන් වරප්‍රසාද භුක්ති වින්ද අතර සාමාන්‍ය ජනතාවගේ ජීවිතය දැඩි දුෂ්කරතා මැද ගෙවා දැමීම ද මෙහි විශේෂ ලක්ෂණ අතර විය

### වැඩවසම් සමාජ ක්‍රමය බිඳවැටීමට බලපෑ සාධක/ නූතන යුගයේ උදාව

1. ප්‍රවේණි දාසයන් රාජකාරි ක්‍රමය වෙනුවට මුදලින් ගෙවීමේ ක්‍රියාවලි ආරම්භ කිරීම
2. ප්‍රවේණිදාස ක්‍රමයේ බිඳවැටීම
3. වෙළඳාම දියුණුවීම සහ ධාන්‍ය වෙළඳපොළවල් සොයා ගැනීම
4. නගර වර්ධනය
5. පුනරුදය
6. ජනගහන වර්ධනයේ වෙනසක් ඇතිවීම

### යුරෝපයේ ජාතික රාජ්‍යයන්ගේ ප්‍රභවය සහ වර්ධනය

- ජාතික රාජ්‍ය ගොඩනැගීමට උපකාරී වූ නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධානතම ලක්ෂණය වූයේ රජ වෙත සියළු බලතල කේන්ද්‍රගත වූ පාලන ක්‍රමයයි.
- රජවරුන්ගේ උපදේශකයන් සහ රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් ඇතිවූ වර්ධනය නව රාජාණ්ඩු ක්‍රමයේ කැපී පෙනුණ තවත් ලක්ෂණයකි.
- රජවරුන්ගේ බලය වර්ධනය වූ අතර රජු යටතේ ජාතික මුහුණුවරක් ඇතිව සංවිධානය වූ එම හමුදා ජාතික රාජ්‍යවල වැඩීමට දායක වූහ.
- වාණිජවාදය නමින් හැඳින්වෙන ආර්ථික දර්ශනයක් නව රාජාණ්ඩු ක්‍රමය යටතේ අනුගමනය විය. ඝනරන්වාදය හිතකර වෙළඳ ශේෂය රාජ්‍ය ආර්ථික කටයුතුවලට මැදිහත්වීම සහ පාලනය කිරීම සහ ස්වයංපෝෂිත වීම යනාදිය වාණිජවාදයේ ප්‍රධාන ලක්ෂණ විය

### වැඩවසම් සමාජ ක්‍රමය බිඳවැටීමට බලපෑ සාධක/ නූතන යුගයේ උදාව

7. ගොවි කැරැලි හා සාමාන්‍ය ආරවුල් 1381, 1385, 1394 හා 1426 වර්ෂ වල ඇති වීම
8. ජාත්‍යන්තර යුද්ධ 1381-1453 සියක් අවුරුදු යුද්ධය එංගලන්තය හා ප්‍රංශය අතර සිදුවීම
9. රදළ ඉඩම් ගොවීන්ට බෙදාදීම
10. ප්‍රබල ජාතික ආණ්ඩු බිහිවීම

### ජාතික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතාවයේ වෙනස්කම් ඇති වීම.

- වාණිජවාදය යනු කුමක් ද?

1 16 වන සියවසේ පටන් 18 න සියවස දක්වා තරම් කාලයක් තුළ බටහිර යුරෝපයේ රටවල් කිපයක සිටි ලේඛකයින්ගේ අදහස් හෝ ලියවිලි තුළ දක්නට ලැබෙන කිසියම් පොදු අදහස් මාලාවකි. ආර්ථිකමය ප්‍රශ්ණයක් පිළිබඳව පොදු අදහස් මාලාවක් විවිධ රටවල ලේඛකයින් මේ කාලයේ දරා ඇත.

2 16 න සියවසට පෙර කාලය සැබවින් ම සරල ආර්ථිකයක් සහිත වූ කාල වකවානුවක් සහ ක්‍රමයෙන් වෙළඳ සහ වාණිජ ව්‍යාපාර කරා ආර්ථිකයන් විපර්යාසයන්ට ගමන් කළ අවධියක් වශයෙන් ද හැඳින්විය හැක.

3 මීට කලින් මනාව ඒකාබද්ධ වූ ජාතික රාජ්‍ය අපගතු වූ නමුත් වැඩවසම් සමාජ ක්‍රමය ක්‍රමයෙන් පරිහානිය කරා ගමන් කිරීමේදී ඒකාබද්ධ ජාතික රාජ්‍ය බිහිවීම සඳහන් කළ හැක.

### යුරෝපයේ ජාතික රාජ්‍යයන්ගේ ප්‍රභවය සහ වර්ධනය

- මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය පරිහානියට පත්ව නූතන යුගය උදාවෙද්දී දේශපාලන රටාවේ පුළුල් පරිවර්තනයක් ඇතිවිය. සියවස් කිපයක් තිස්සේ ක්‍රමයෙන් සිදුවූ මේ පරිවර්තනයෙන් බිහිවූ අළුත් දේශපාලන රටාව නව රාජාණ්ඩු ක්‍රමය යනුවෙන් හැඳින්වෙයි.
- වැඩවසම් යුගයේ පිරිහීමත් සමග 12 සියවසේ පමණ සිට විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම්වලට අනුරූපව දේශපාලන ක්ෂේත්‍රයේද පරිවර්තනයක් ඇති කරමින් ප්‍රාදේශීය පාලන ඒකක සියල්ල යුද්ධ විවාහ සම්බන්ධතා උරුමය ආදී නොයෙකුත් උපක්‍රම අනුගමනය කරමින් එක් පාලකයෙකු යටතේ එක්සත් කිරීමේ ක්‍රියාවලියක් යුරෝපයේ මතුවෙමින් තිබිණ.

### වාණිජවාදය දර්ශනයක් වශයෙන් ව්‍යාප්තවීමට බලපෑ හේතු

1. දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්වීම්. වාණිජ ධනවාදය කරා ගමන් කිරීම - වෙළඳ හා වාණිජ ව්‍යාපාරික කටයුතු වල වෙනස්වීම කර්මාන්තය සමග සම්බන්ධවීම
2. රත්රන් සොයා ගැනීම තුළින් සිය වෙළඳ ශේෂයේ අතිරික්තයක් තබා ගැනීමට කටයුතු කිරීමේ දී ඇඩී ආරක්ෂණවාදයක් කරා ගමන් කිරීම
3. බලය වැඩි කිරීම හා නිදහස රැක තබා ගැනීම පිණිස හැම අංශයකම ජාතික කටයුතු සංවිධානය විය. පෞද්ගලික යහපත, ප්‍රාදේශීය යහපත හා කොට්ඨාශවල යහපත රජයේ යටත් විය. ශක්ති සම්පන්න මධ්‍යම ආණ්ඩුවක අවශ්‍යතාව තහවුරු කිරීම, ජාතික රාජ්‍ය

### වාණිජවාදය දර්ශනයක් ව්‍යාප්තවීමට බලපෑ හේතු

4. තරඟකාරී වෙළඳ ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කරමින් ඒකාධිකාරී ප්‍රතිපත්තියක් යෝජනා කිරීම සහ පාරිභෝගික පංතියට වඩා වාණිජ පංතිය ආරක්‍ෂා කරමින් දේශීය වෙළඳපොළ ප්‍රවර්ධනයට පියවර ගැනීම
5. විශාල ජනගහනයක් ආර්ථික ක්‍රමට හිතකර වීම

- සුළු ඉඩම් හිමියා අතුරුදහන් වීම

  මෙම ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වූයේ සුළු ඉඩම් ප්‍රමාණයක් අයිති තැනත්තන් සහ අඳ ගොවීන් විශාල වශයෙන් අසාධාරණයට පාත්‍රවීමයි.

මහා පරිමාණ වශයෙන් කෘෂි අංශය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම කෘෂි අංශයෙන් යහපත් තත්ත්වයක් ගොඩා නගා ගැනීමට සමත්වුවත් සාමාන්‍යය ජන ජීවිතය සංකීර්ණත්වයට පත්වීම

### 18 න සියවසේ බ්‍රිතාන්‍යය කෘෂිකාර්මික විප්ලවය (II ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය)

- දෙවන ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය

  මහ බ්‍රිතාන්‍යයේ ආර්ථික ඉතිහාසය තුළ කෘෂිකාර්මික විප්ලවය කරන ලද කාර්යභාරය අතිශයින් වැදගත් විය. මන්ද එය මූලික වශයෙන් කාර්මික විප්ලවය සඳහා අවශ්‍යය බොහෝ දේ සපයාදීමට සමත්විය.

කෘෂිකර්මාන්තය බොහෝදුරට මේතාක් ගොඩ නැගී තිබුණේ වැඩවසම් සමාජයෙන් ගමන් ගත් සාම්ප්‍රදායික ක්‍රමවේද අනුවයි. පසුව එය වේගවත් වර්ධනයක් සඳහා වෙනස්කිරීමට නව ක්‍රමවේද අනුව සංවිධානය කිරීම

### කාර්මික විප්ලවය සහ ඒ ආශ්‍රිත ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම්

1. කාර්මික විප්ලවය හා එංගලන්තය.

   විශාල වශයෙන් කාර්මික විප්ලවය ගොඩ නැගීම සඳහා විශාල පහසුකම් රැසක් ක්‍රමානුකූලව එංගලන්තය සතුවීම. දෙවනුව ප්‍රංශය, ජර්මනිය හා රුසියාව කාර්මික විප්ලවයෙන් උසස් තත්ත්වයට පත්වීම.

2. සමාජ ආර්ථික හා දේශපාලන වශයෙන් සමාජ විපර්යාසයන් ඇති වීම.

3. නව කම්කරු ව්‍යාපාර හරහා වෘත්තීය සංගම් මෙන්ම දේශපාලන පක්ෂ තුළින් කම්කරුවන් සංවිධානය වීම. එක් අතකින් සමාජවාදී අදහස් ව්‍යාප්ත වීම සිදුවූ අතර අනෙක් අතට රජය අවම වශයෙන් හසුකිරීමක් සහිත ලිබරල්වාදී ප්‍රතිපත්ති ව්‍යාප්තවීම යුරෝපීය සමාජය දැකිය හැකිවීම සුවිශේෂ ලක්ෂණයකි.

- ජනගහනය වේගයෙන් වර්ධනය වීම සහ ඊට සමාන්තරව පැරැණි ක්‍රමවේද අනුව නිෂ්පාදනය ශක්තිමත් කිරීමට ඇති නොහැකියාව මත මෙම නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ කටයුතු කිරීමට පියවර ගැනීම අතිශයින් වැදගත් සහ සාර්ථකත්වයක් ගත් ක්‍රියාමාර්ගයක 'වශයෙන් පෙන්වාදිය හැක.
- මෙම ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලවලට අනුව කෘෂි අංශය ආශ්‍රිතව සාර්ථකත්වයක් ගත් නමුත් සාමාන්‍යය ජන ජීවිතය කෙරෙහි මෙම මහා පරිමාණ කෘෂි ව්‍යාපාරය අහිතකර ප්‍රතිවිපාක රැසක් ඇති කිරීමට හේතු සාධක විය.

### කාර්මික විප්ලවය

- 18 වන සියවසේ අග භාගයේ සිට වසර සීයක් පමණ කාලයක් තිස්සේ යුරෝපයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සීඝ්‍රයෙන් සිදුවූ වෙනස්කම් රැසක් කාර්මික විප්ලවය ලෙස හැඳින්විය හැකිය. කාර්මික ක්‍රම හා සංවිධාන පිළිබඳ වෙනස්වීම. ගෘහ ක්‍රමයෙන් කර්මාන්ත ශාලා ක්‍රමයටද අත්වැඩ වලින් යන්ත්‍ර වැඩ වලට පරිවර්තනයක් වී තිබීණ.
- වෙනස් වීම ඉතා සෙමින් නමුත් ක්‍රමික කාර්මික විපර්යාසයක් :
  - රෙදි පිළි කර්මාන්තයේ යන්ත්‍ර සූත්‍ර භාවිතයේ දියුණුව
  - ඉංජිනේරු, යකඩ හා වානේ, රසායනික නිෂ්පාදනයේ දියුණුව, ගල් අඟුරු බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර සූත්‍ර සහ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර සූත්‍ර නිපදවීම ආශ්‍රිත මෙම ක්‍රමානුකූල දියුණුව අත්පත් කර ගැනීම

## කාර්මික විප්ලවය

- කාර්මික විප්ලවය සිදු වූ කාල පරිච්ඡේදයන් පිළිබඳ විමසිලිමත් වීමේ දී විපර්යාසට ගත වූ කාල පැහැදිලි වෙයි.
  - 1760-1830 එංගලන්තය
  - 1850-1890 ජර්මනිය
  - 1860-1900 රුසියාව

### කාර්මික විප්ලවය

- කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භවීමට හේතු:

1. නූතන යුගය වන විට වෙළඳ හා වාණිජ කටයුතු හේතු කොට ගෙන යුරෝපීය ජාතිකයින් ලෝකයේ ධනවතුන් බවට පත්වී තිබුණි. මේ අතර එංගලන්තය පෙරමුණ ගත් අතර කර්මාන්ත සඳහා ආයෝජනය කළ හැකි පිරිසක් ඉතාම ධනවත් පිරිසක් මෙහි වාසය කිරීම
2. එංගලන්තයේ දේශීය මෙන්ම විදේශීය වෙළඳාම පුළුල් වී තිබීම. 16 සියවසේ පටන් යුරෝපා ජාතීන් ආසියා අප්‍රිකා හා ලතින් ඇමෙරිකානු මහාද්වීප වල යටත් විජිත පිහිටුවා තිබීම නිසා වෙළඳ කටයුතු සඳහා නව වෙළඳපොළවල් විය.
3. යුරෝපයේ වසර ගණනාවක් පැවතුණු යුද්ධ අවසන්වීම නිසා මරණ සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහත වැටීමේ සාපේක්ෂව ජනගහනය වර්ධනය වීම නිසා දේශීය වෙළඳ පොළ පුළුල් විය.
4. අධික ජනගහනය නිසා භාණ්ඩ ඉල්ලුමෙහි ඇති වූ විශාලත්වයට සාපේක්ෂව කුඩා පරිමාණයෙන් හෝ හස්ත කර්මාන්තයේ නිෂ්පාදන ප්‍රමාණවත් නොවීම හමුවේ නව තාක්ෂණික විපර්යාසයක අවශ්‍යතාව ඉස්මතුවීම

### බටහිර යුරෝපයේ ධනවාදය

- 12 වන සියවස පමණ සිට සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ වෙළඳ සහ වාණිජ කටයුතු හේතුකොටගෙන යුරෝපීය ව්‍යාපාරිකයෝ ලොව පුරා ආර්ථික ක්ෂේත්‍රයේ බලවත් තත්ත්වයක් හිමි කර ගනිමින් සිටියහ. ඒ නිසා කාර්මික විප්ලවය ආරම්භ වීමට ආසන්න සමයේ බටහිර යුරෝපය ලෝකයේ සෙසු සියළු ප්‍රදේශවලට වඩා ධනවත්ව පැවතිණ.
- ජාතික රාජ්‍යවල පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්තීන් කාර්මික විප්ලවයට අවශ්‍ය පසුබිම සකස් කළ ප්‍රධාන සාධක විය.
- අනෙක් සාධකය වූයේ 16 වන සියවස ආරම්භයේ සිට බටහිර යුරෝපා ජාතීන් ආසියා අප්‍රිකා ලතින් ඇමෙරිකා යන මහාද්වීපවල යටත්විජිත පිහිටුවීම නිසා යුරෝපීය වෙළඳ කටයුතුවලට අළුත් ප්‍රදේශ විවෘත වී වෙළඳපොළ පුළුල් වීම

### කාර්මික විප්ලවය

5. බොහෝ විට යටත් විජිතවලින් කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගත හැකිවීම සහ විශාල වශයෙන් එංගලන්තය සතුවූ යකඩ හා ගල් අඟුරු වැනි බහුල වූ සම්පත් කාර්මීකරණයට මග හෙළි කිරීම.
6. යුරෝපයේ ඇති වූ පුනරුදය හා විද්‍යාත්මක දැනුම පුළුල් වීම නිසා යන්ත්‍ර සූත්‍ර නිපදවීමට අවශ්‍ය දැනුම වර්ධනය විය.
7. ඉඩම් විශාල ව්‍යාපාරික ස්ථාන බවට පත්කළ කෘෂිකාර්මික විප්ලවය සෙසු රටවලට වඩා පුළුල් ලෙස එංගලන්තයේ තිබීම. කුඩා ඉඩම් එකතු කර විශාල ගොවිබිම් සෑදීම නිසා කුඩා ඉඩම් හිමියාට ඉඩම් අහිමි වූ අතර ඒ අය සිය ජීවනෝපාය සඳහා රැකියා සොයා නගරවලට සම්ප වීම නිසා අතිරික්ත ශ්‍රමය කාර්මික විප්ලවයේ ආරම්භයට මග සෑදීම.
8. අභ්‍යන්තර තීරු බදු නොමැතිවීම නිසා නිදහස් වෙළඳපොළ අවශ්‍යතා සඳහා කටයුතු කිරීම පහසු විය.

### කාර්මික විප්ලවය

- කාර්මික විප්ලවය මුලින් එංගලන්තයේ ඇතිවීම සඳහා කරුණු රැසක් බලපෑම
- කාර්මික විප්ලවය නිසා ඇති වූ ආර්ථික සාමාජික හා දේශපාලන අංශයන්ගෙන් වූ විප්ලවය කාර්මික විප්ලවය මෙන් ඉතා වැදගත්. ඇත්ත වශයෙන් කාර්මික විප්ලවය නිෂ්පාදකයින්ගේ වට්ටෝරුවක් නොව එම නිෂ්පාදන නිසා සමාජය තුළ ඇති වූ විවිධ අංශයන්ගේ විපර්යාසයයි.
  - ආර්ථික රටාව කෘෂිකර්මාන්තයෙන් කර්මාන්තකරණයට පරිවර්තනය
  - කාර්මික විප්ලවය සඳහා කළ දිග් විජය තවදුරටත් අධිරාජ්‍යවාදය ව්‍යාප්ත කිරීම දක්වා රැගෙනයාම
  - වෙළඳාම ඔස්සේ වාණිජ්‍ය කටයුතු සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම

## කාර්මික විප්ලවය

- සාමාජික අංශයෙන් ගෙන බලන විට මෙම කාලය වන විට එංගලන්ත සමාජය තුළ ව්‍යාප්ත වූ පංති බෙදීම ඔස්සේ ප්‍රබල කම්කරු ජනතාවක් සහ විවිධ රැකියාවන් තුළ නියුක්ත පිරිසක් බිහිවීම.
- කම්කරු ව්‍යාපාර බිහිවීම හරහා වෘත්තීය සංගම් ව්‍යාපාර ආරම්භ කිරීමට කටයුතු කිරීම

බි

## කාර්මික විප්ලවය

- පේෂ කර්මාන්තය
- යකඩ සහ වානේ කර්මාන්තය
- ගල් අඟුරු කර්මාන්තය
- වාෂ්ප එන්ජිම නිපදවීම
- පරිවහනය සහ සංනිවේදනය

### කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය - යුරෝපා මහාද්වීපයේ සාර්ථක නොවීමට හේතූන්

- යුරෝපා මහාද්වීපයේ රටවල සමාජයීය හා ආර්ථික ක්ෂේත්‍රවල විවිධ තරාතිරම්වලට අයත් ජන කොටස් අතර දුරස්ථ බවක් සහ කැපී පෙනෙන විෂමතා තිබුණි.
- යුරෝපා රටවල ආරම්භ වූ කාර්මීකරණ කටයුතු 1789 ආරම්භ වූ ප්‍රංශ විප්ලවයද, නැපෝලියානු යුද්ධ මාලාව නිසා ද අඩාල විය.
- නැපෝලියන් යුද්ධ අවසන් වී යුරෝපයට සාමය උදා වුවද ප්‍රංශය ජර්මනිය ආදී රටවල ව්‍යාපාරික ප්‍රජාව යුද්ධයෙන් හෙම්බත් වී අධෛර්යමත්ව සිටි හෙයින් නවීන ක්‍රම ගැන වෙහෙසෙනවාට වඩා පැවති ක්‍රම අනුව ම නිෂ්පාදන සහ ආලෙවි කටයුතු පවත්වා ගැනීමට යොමුවීම

### කාර්මික විප්ලවය මුල් කාලයේ දී සෙසු රටවලට ව්‍යාප්ත නොවීමට හේතු

ප්‍රංශය

1. බැර කර්මාන්ත දියුණුවීමක් මුල් කාලයේ දැකිය නොහැක.
2. නැපෝලියන් යටතේ හැකිතාක් රාජ්‍ය මැදිහත්වීම මත කර්මාන්ත ශාලා නැංවීමට කටයුතු කිරීම.
3. ප්‍රංශයේ වූ අභ්‍යන්තර තීරු බදු ක්‍රම
4. ප්‍රංශය තුළ එංගලන්තයේ මෙන් ඉඩම් කොටු කිරීම සිදු නොවීම හේතු කොට කුඩා ඉඩම් හිමි පිරිස වැඩි වීම.
5. ප්‍රංශ විප්ලවය නිසා කර්මාන්ත ශාලා මෙන්ම යන්ත්‍ර සූත්‍ර විශාල වශයෙන් විනාශවීම
6. එංගලන්තය ස්වකීය නිෂ්පාදන බාහිර ලෝකයට විවෘත නොකිරීම


### කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය - යුරෝපා මහාද්වීපයේ සාර්ථක නොවීමට හේතූන්

- යුරෝපා මහාද්වීපයේ රටවල සමාජයීය හා ආර්ථික ක්ෂේත්‍රවල විවිධ තරාතිරම්වලට අයත් ජන කොටස් අතර දුරස්ථ බවක් සහ කැපී පෙනෙන විෂමතා තිබුණි.
- යුරෝපා රටවල ආරම්භ වූ කාර්මීකරණ කටයුතු 1789 ආරම්භ වූ ප්‍රංශ විප්ලවයද, නැපෝලියානු යුද්ධ මාලාව නිසා ද අඩාල විය.
- නැපෝලියන් යුද්ධ අවසන් වී යුරෝපයට සාමය උදා වුවද ප්‍රංශය ජර්මනිය ආදී රටවල ව්‍යාපාරික ප්‍රජාව යුද්ධයෙන් හෙම්බත් වී අධෛර්යමත්ව සිටි හෙයින් නවීන ක්‍රම ගැන වෙහෙසෙනවාට වඩා පැවති ක්‍රම අනුව ම නිෂ්පාදන සහ ආලෙවි කටයුතු පවත්වා ගැනීමට යොමුවීම


### කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය - යුරෝපා මහාද්වීපයේ සාර්ථක නොවීමට හේතූන්

- ප්‍රංශය
- එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය වැඩිකල් නොගොස් යුරෝපා මහාද්වීපයටද අනතුරුව ලෝකයේ සෙසු ප්‍රදේශවලටද ව්‍යාප්ත විය.
- 18 වන සියවසේදී එංගලන්තයටද වඩා ධනවත් හා ජනාකීර්ණ වූ ප්‍රංශ අධිරාජ්‍යය ආර්ථික වශයෙන් ද එංගලන්තයට සිටි ප්‍රබලතම තරඟකරුවා විය. එසේ වුවද වැඩවසම් කෘෂි සමාජය කාර්මීකරණය කිරීමේ දී සිදුවිය යුතු ආකල්පයම වෙනස ප්‍රංශය තුළ වර්ධනය නොවීය.

- <u>ප්‍රංශය</u>

1. ප්‍රංශය කර්මාන්ත වලට බලපෑ ප්‍රධාන බාධක වශයෙන් වූයේ පෞද්ගලික ව්‍යවසායකත්වයක් නොමැතිකම සහ ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන හිඟකම
2. පසුව රජය සෘජුව මැදිහත්වීම තුළ පෞද්ගලික අංශය දිරිමත් කිරීම
3. රිඩින් තීරු බදු ගිවිසුම අහෝසි කොට ළඳරු කර්මාන්ත ආරක්ෂණයට පියවර ගැනීම
4. දුම්රිය ව්‍යාපාරය දියුණුවීම 1830-1840

- රුසියාව

1. 1890 න් පසුව කාර්මික විප්ලවය ඇ වීම
2. සැබෑ කාර්මික විප්ලවයට ප්‍රවේශ වන්නේ 1917 න් පසුවයි
3. රුසියානු කාර්මික විප්ලවය ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වයි.
   I – 1860-1890 විප්ලවයට පදනම දැමීම
   II - 1890-1917 කාර්මික දියුණුව ඇතිවීම
   III – 1917 විප්ලවයෙන් පසු ඇති වූ සීඝ්‍ර දියුණුව

කාර්මික විප්ලවය පසු කාලයේ දී සෙසු රටවලට ව්‍යාප්ත වීමට හේතු

1. යුරෝපා මහාද්වීපය තුළ පමණක් නොව යටත් විජිත ආශ්‍රිතව ද ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම.
2. යුරෝපා මහාද්වීපය තුළ ගමනාගමන කටයුතු හා ප්‍රවාහන සේවාවන්ගේ වර්ධනය (ප්‍රංශයේ ඇති වූ නාවික කටයුතු වල සීඝ්‍ර වර්ධනය, මහමාර්ග හා ඇළ මාර්ග ඉදිකිරීම, ඔස්ට්‍රියානු අධිරාජ්‍යයේ සැතපුම් 30,000 ක් දුර මහමාර්ග ඉදිකිරීම, බෙල්ජියමේ මාර්ග පද්ධති දෙගුණයකින් පුළුල් කිරීම සහ 1840 වන විට දුම්රිය මාර්ග කටයුතු විශාල වූ සංවර්ධනයක් ලබා තිබීම.
3. කර්මාන්ත සහ මාර්ග ඉදිකිරීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම
4. තීරු බදු ඉවත්කිරීම නිසා පහසුවෙන් අමුද්‍රව්‍ය සොයා ගත හැකිවීම
5. ප්‍රංශයේ හා ජර්මනියේ යකඩ හා ගල් අඟුරු සොයා ගැනීම

- ජර්මනිය

1. 18 න සියවස අවසානයේදී යුරෝපයේ අනෙක් රටවලට වඩා හාත්පසින් ම වෙනස් ක්‍රමයකින් ඇරඹීම
2. ශ්‍රේණි ක්‍රම අහෝසි කිරීම
3. ඉතා කෙටි කාලයක් තුළ සීඝ්‍ර දියුණුවක් ඇතිවීම
4. දුම්රිය ව්‍යාපාර දියුණුවීම නිසා කර්මාන්ත නොසිතූ අයුරින් දියුණුවීම
5. 1871 න් පසු කාලයේ දී විශේෂයෙන් ප්‍රංශයට වඩා වේගයෙන් ජර්මනියේ බැර කර්මාන්ත දියුණුවීම
6. රාජ්‍යය අනුග්‍රහය ඇතිව වේගයෙන් බැංකු පද්ධතිය දියුණුවීම

කාර්මික විප්ලවය දේශපාලන ක්ෂේත්‍රයේ ඇති කරන ලද වෙනස්කම්

1. ධනවත් වූ පිරිස සිය ධනයෙන් කර්මාන්ත ශාලා ආරම්භ කළ අතර කම්කරුවන් විශාල වශයෙන් එහි සේවා නියුක්ත වුවද, ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැතිකම හමුවේ කම්කරුවන් විශාල වශයෙන් දැඩි පීඩනයට හා අපහසුතාවට පාත්‍රවීම.
2. නිරන්තර ගැටුම්, වෘත්තීය සංගම් ව්‍යාපාර, සේවක වැඩ වර්ජන සහ දේශපාලන පක්ෂ බිහිවීම දක්වා වූ ව්‍යාප්තියක් මේ ඔස්සේ නිර්මාණය වීම.
3. ධනේශ්වර ක්‍රමයට ආර්ථික න්‍යාය සපයාදෙමින් ලිහිල්කරණ ක්‍රියාවලියක අවශ්‍යතාව තහවුරු කිරීම
4. 1850 න් පසු බිහිවූ නව අධිරාජ්‍යවාදය, සමාජවාදය, ලිබරල්වාදය හා ධනවාදය මෙසේ කාර්මික විප්ලවයෙන් බිහිවූ දේශපාලන වෙනස්වීම් වශයෙන් සඳහන් කළ හැක.

විදේශීය තරගය සහ එංගලන්තයේ කාර්මික උච්ඡාවචනය

- 19 න සියවස අවසානය වන විට එංගලන්තය එතෙක් භුක්ති වින්ද කාර්මික ආධිපත්‍ය ඇයට අහිමි යන ලකුණු පහළ විය.

1 ජර්මනිය, ඇමෙරිකාව කාර්මික භාණ්ඩ නිෂ්පාදනයෙන් එංගලන්තය සමඟ තරග කළ හැකි කාර්මික රටවල් දෙකක් බවට පත්වීම
2 මෙම රටවල් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීම
3 එංගලන්තයේ බොහෝමයක් නිෂ්පාදන ඉලක්ක පසු කිරීමට 19 සියවස අවසානයට මෙම රටවලට හැකිවීම. යකඩ, වානේ, ගල් අඟුරු, යන්ත්‍රෝපකරණ, රෙදි පිළි නිෂ්පාදනයෙන් එංගලන්තය අභිබවා යමින් කාර්මික නිෂ්පාදනයේ ප්‍රමුඛත්වය හිමිකර ගැනීමට මෙම රටවල් සමත්වීම කැපී පෙනෙන ලක්ෂණයකි.

කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

- කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වී යුරෝපා මහාද්වීපයේ පමණක් නොව ඇමෙරිකා ආසියා අප්‍රිකා මහාද්වීපවලට ද ව්‍යාප්ත වී ලොව පුරා ම සමාජ ආර්ථික ක්ෂේත්‍රවල පුළුල් වෙනස්කම් ඇති කළේය. එහි ප්‍රතිඵල ද මුලින්ම විද්‍යාමාන වූයේ එංගලන්තයේ ය. සමස්තයක් වශයෙන් ඇතිවූ ප්‍රතිඵල මෙසේ සම්පිණ්ඩණය කොට දැක්විය හැක.

1. වෙළඳ සහ වාණිජ කටයුතු දියුණුවීම
2. නාගරීකරණය
3. ධනවාදයේ වර්ධනය සහ සමාජ විපර්යාසය

## ප්‍රංශ විප්ලවය

- ප්‍රංශ විප්ලවය ආර්ථික හා දේශපාලන හේතූන් බලපෑම හේතු කොට ගෙන ඇති වූ ක්‍රියාවලියක් හෙයින් එය *ආර්ථික දේශපාලන විප්ලවයක්* වශයෙන් හඳුන්වයි.
- නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය පදනම් කරගෙන මිනිසා උතුම් කොට සැලකිය යුතුය යන මානවවාදී අදහසින් ප්‍රංශ විප්ලවය ආරම්භ වී ඇත.
- විප්ලවයේ ස්වභාවය: 1789.08.29 දින මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය එළි දැක්වීම තුළින් සියළු මිනිසුන් එක සමානය යන්න තහවුරු කිරීම. (ඔවුන් නීති සම්පාදනයට සහභාගී විය යුතු අතර අදහස් ප්‍රකාශ කිරීමට හා අයුක්තියට නැගී සිටීමට ඇති අයිතිය ද මෙයින් තහවුරු කරන ලදී,
- රදල හා පූජක බලතල ද අහෝසි කෙරුණු අතර 1791 දී නව ව්‍යවස්ථාවක් පැනවීම සිදු විය.

## ප්‍රංශ විප්ලවය

- ආර්ථික හේතු:

1. ප්‍රංශයේ රදලයින් සහ පූජකයින් බදු වලින් නිදහස් කෙරුණු අතර ගොවීන් රජයට, පල්ලියට හා රදලයින්ට බදු ගෙවිය යුතු විය. විවිධාකාර වූ මෙම බදු අයකිරීම නිසා බදු බරින් ජනතාව අසීමිතව පීඩනයට ලක්විණි. උදා. සිය ආදායමින් 50-60 % ක් අතර වූ ප්‍රමාණයක් බදු ලෙස ගෙවිය යුතු විය.
2. යුරෝපයේ පුනරුදයත් සමග වෙළඳාමෙන් පොහොසත් වූ නව ධනවත් මධ්‍යම පංතියට පාලන කටයුතු වලට සහභාගී වීමට අවස්ථාවක් නොවුන.
3. රබින් ගිවිසුම (එංගලන්තය) මේ යටතේ 1786 දී ඇති කළ මෙම ගිවිසුම නිසා රෙදිපිළි ආනයනයන්හිදී තීරු බදු ඉවත් කිරීම. එංගලන්තය නිෂ්පාදනය සඳහා යන්ත්‍ර භාවිතය නිසා එහි නිෂ්පාදන වියදම් අඩුවීමෙන් ප්‍රංශ කුඩා කර්මාන්ත වලට ඒ හා තරග කිරීමට අපහසු වීමෙන් ප්‍රංශ නිෂ්පාදන අඩාල විය.
4. විදේශ යුද්ධය නිසා මේ වන විට රාජ්‍ය භාණ්ඩාගාරය බංකොලොත් වීම
5. වැටුප් විෂමතා

## ප්‍රංශ විප්ලවය

- දේශපාලන හේතු:

1. ප්‍රංශයේ සෙසු යුරෝපා රටවල මෙන් දේශපාලන ප්‍රතිසංස්කරණ ඇති නොවීය. උදා: එංගලන්තයේ පාර්ලි. ක්‍රමයක් තිබී වූ අතර ප්‍රංශයේ දීඝවම රාජාණ්ඩු පැවතුණි.
2. ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය ඒකාධිපති ස්වරූපයක් ගත් අතර මහජනතාව හා අනතුත් මහජන නියෝජිත ආයතන නොසලකා හරින ලදී,
3. රාජාණ්ඩුවට බලය සංකේන්ද්‍ර ගත වීම නිසා පළාත් පාලන ආයතන කටයුතු ප්‍රමාද වීම. මේ නිසා අකාර්යක්ෂම පරිපාලනයක් බිහිවීම.
4. ප්‍රංශයේ අධිකරණ කටයුතු වල ව්‍යාකූලතාවයක් පැවතුණි. ඔක් එක් ප්‍රදේශවලට වෙන් වූ ප්‍රවිශේෂ වූ නීති 360 ක් පමණ තිබුණි. තවද රජුට අවශ්‍ය විටෙක පුද්ගලයාට එරෙහිව වරෙන්තු නිකුත් කිරීමට හැකිවීම හා බන්ධනාගාර ගත කිරීමට තිබූ අසීමිත වූ බලතල ද මෙම මෙම ප්‍රංශ විප්ලවයට හේතු සාධක වී ඇත.

## ප්‍රංශ විප්ලවය

- ආර්ථික හේතු:

6. ජනගහනය ප්‍රංශයේ තියුණු ලෙස වැඩිවීම හා රට සමානව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය පසුබිම නිර්මාණය නොවීම. වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය අඩුවීම, පැරණි නිෂ්පාදන ක්‍රම භාවිත කිරීම, බදු බර සහ ඉඩම් කොටු කිරීම මේ යටතේ ප්‍රධාන වෙයි.
7. තවදුරටත් ආර්ථික පරිභානිය වර්ධනය වීමට
   - මධ්‍යම පංති නායකත්වය
   - ප්‍රාචීණිදාස භාවය හා වැඩවසම් ආර්ථික ක්‍රමය
8. රදළයින් සිය ආහාර හිගය අවම කර ගැනීම සඳහා රදලයින් ධනේශ්වර ඉඩම් විශාල වශයෙන් කොටු කර ගැනීම
9. දුර්භික්‍ෂ, නියග වැනි සාධක ද ප්‍රංශ විප්ලවය වේගවත් වීමට බලපාන ලදී,

## ප්‍රංශ විප්ලවය

- දේශපාලන හේතු:

5. කණ්ඩායම් අතර පංති ගැටුම මෙම විප්ලවයට මුල පුරන ලදී, කණ්ඩායම් වශයෙන් ගත් කළ
   - ප්‍රාචීණිදාසයන් හා ඉඩම් හිමියන් අතර 1789 අරගලය
   - රදල පංතිය හා මධ්‍යම පංතිය
   - රදල පංතිය හා ගොවි පංතිය

   පංති බෙදීම සම්පූර්ණයෙන් ආර්ථික සාධක මත පදනම් වුවකි.
6. ප්‍රංශ ආර්ථිකයේ පැවති බංකොලොත්භාවය, යුද්ධය සඳහා විශාල වශයෙන් මුදල් වැය කිරීම නිසා ප්‍රංශය අධික ණය බරින් යුක්ත වීම

## ප්‍රංශ විප්ලවය

- වෙනත් සාධක:

1. 18 න සියවසේ විවත් වූ මොන්ටෙස්කියු, වෝල්ටෙයාර් හා රූසෝ වැනි දාර්ශණිකයන් ඉදිරිපත් කළ මානව වාදී අදහස්
2. බ්‍රිතාන්‍ය තුළ තිබූ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රංශ රාජාණ්ඩුව වැටීමට හේතු විය.
3. 1776 දී සිදු වූ ඇමෙරිකානු නිදහස් සටන ද මෙයට බලපෑවේ ය.

වි

## ප්‍රංශ විප්ලවය

- ප්‍රංශ විප්ලවයේ_ප්‍රතිඵල
- විප්ලවය ක්ෂණික සිදුවීමක් නොව වසර කීපයක් පුරා ක්‍රියාත්මක වූ විශාල බලවේගයකි. මෙය ප්‍රංශය තුළ ක්‍රියාත්මක වුවත් අනාගත ලෝක දේශපාලන ක්ෂේත්‍රයට එමගින් විශාල අත්දැකීම් හා ආදර්ශයන් රැසක් ලැබුණි
- කලින් විප්ලව පැවතුණත් ප්‍රංශ විප්ලවය තුළින් මිනිස් අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් නොකෙරුණි.
- ප්‍රංශ විප්ලවයේ මූලික සටන් පාඨ වූ නිදහස සමානාත්මතාව සහෝදරත්වය යන පාඨ මගින් ජනිත කළ චින්තනය යුරෝපයේ සෙසු රටවල් කරා ද ව්‍යාප්ත විය

## ජාතික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතාවයේ වෙනස්කම් ඇති වීම.

රාජ්‍ය නිර්බාධවාදය ව්‍යාප්තවීම.

1 ඇඩම් ස්මිත් ධනේශ්වර ක්‍රමයට න්‍යායාත්මක පදනමක් තර්කානුකූලව ලබාදුණි. ආර්ථික කටයුතු වල බාධාවකින් තොරව නිදහසේ යෙදීමට ජනතාවට ඉඩදීමෙන් උපරිම දියුණුව උදා කොට ගත හැකි බව ධනවාදය ලොව පුරා ව්‍යාප්ත කරලීමට උපකාර වූ රාජ්‍ය නිර්බාධවාදය එංගලන්තය ප්‍රධාන බටහිර යුරෝපය පුරා ඉන් අවතුරුව සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම.

2 කාර්මීකරණය ලොව පුරා ව්‍යාප්තවීමත් අඩුමිලට අමුද්‍රව්‍ය ලබාගැනීමත්, නිෂ්පාදිත භාණ්ඩ වැඩිමිලට විකුණා ගැනීමේත් අරමුණ ඇතිව යුරෝපා ජාතීන් තම අධිරාජ්‍ය පුළුල් කර ගැනීමටත් යටත් විජිතවල පූර්ණ දේශපාලන ආධිපත්‍ය ලබා ගැනීමටත් කටයුතු කිරීම මේ යුගයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් විය.

3 ඒ අනුව යුරෝපයේ 1850 න් පසුව ඇතිවූ අධිරාජ්‍යවාදය නව අධිරාජ්‍යවාදය ලෙස ද හඳුන්වාදිය හැක.

## ප්‍රිසියෝක්‍රැටිවාදය

- 18 න සියවසේ දෙවන භාගයේ ප්‍රංශ විප්ලවයට මදක් ආසන්න කාලයේ ප්‍රංශයේ පැන නැගුණු අදහස් මාලාවකි.

- වාණිජවාදය බටහිර යුරෝපයේ විශේෂයෙන් එංගලන්තයේ පසුබසිමින් තිබියදී සහ කාර්මික ධනේශ්වර ක්‍රමය නැගී එමින් ආ අවධියක ආර්ථික චින්තනයේ වඩාත් පරිණත තත්ත්වයක් කරා ගමන් කළ අවධියක් වශයෙන් මෙය සඳහන් කළ හැක.

## 19 වන සියවසේ යුරෝපයේ සමාජවාදී චින්තනය

- 19 වන සියවසේ යුරෝපයේ බිහිවූ දේශපාලන මති මතාන්තර අතර සමාජවාදී චින්තනය විශේෂයෙන් වැදගත් වෙයි.
- මේ චින්තනයේ ප්‍රධාන කර්තෘවරුන් වූයේ කාල් මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස් යන දෙදෙනාය.
- මොවුන් සිය අදහස් අදහස් ඉදිරිපත් කළ මුල් වකවානුවේ සමාජවාදී චින්තනයත් එය පදනම් කර ගත් ව්‍යාපාරයත් මර්දනය කිරීමට යුරෝපා රටවල පාලකයන් නොයෙකුත් පියවර ගනු ලැබුවද එය යුරෝපය තුළත් ඉන් අනතුරුව ආසියානු අප්‍රිකානු රාජ්‍යවලත් ව්‍යාප්තවීම වැළැක්විය නොහැකි විය.
- සමාජවාදී චින්තනය පදනම් කොටගෙන සමාජවාදී රාජ්‍යයක් පිහිටුවීමට උත්සාහ කළ පළමු රාජ්‍ය වූයේ සෝවියට් රුසියාවයි.

## ප්‍රිසියෝක්‍රැටිවාදයේ ප්‍රධාන ලක්ෂණ

- ආර්ථික චින්තන ඉතිහාසය තුළ ප්‍රථම විධිමත් ගුරුකුලය ලෙස මෙය හැඳින්වීම වැදගත් වන්නේය. ඒ අනුව දර්ශනයක් ලෙස පිළිගැනීමට ඉවහල් වන්නා වූ සාධක කීපයක් මෙසේ පෙළ ගැසිය හැක.

1. ස්වභාවික නීතිය යටතේ සමාජය පාලනය විය යුතුයි.
2. ශුද්ධ නිෂ්පාදිතය සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සියළු ජන කොටස් වල සහභාගිත්වය.
3. කෘෂිකාර්මික නිෂ්පාදනය වඩාත් දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම.
4. ප්‍රාග්ධන සම්පාදනයක් අවශ්‍යතාව පෙන්වාදීම පමණක් නොව එය ජාතික ආර්ථික අවශ්‍යතාව සඳහා යොදා ගැනීමත් අනාගත ආර්ථික අවශ්‍යතා ආර්ථික ලේඛණයක් ඉදිරිපත් කරමින් ප්‍රථම වරට ආර්ථික සැලැස්මක අවශ්‍යතාවය පෙන්වා දීම

## 19 වන සියවසේ යුරෝපයේ සමාජවාදී චින්තනය

- 19 වන සියවසේ සමාජවාදය ප්‍රබල දේශපාලන චින්තනයක් වශයෙන් ඉදිරිපත් වූ අවස්ථාවේ එහි අන්තර්ගත වූ මූලික න්‍යාය කීපයකි. ඒ අනුව සමාජවාදය යටතේ

1. පුද්ගල අවශ්‍යතාවලට වඩා සමාජයේ පොදු දියුණුවටත් පොදු අවශ්‍යතාවලටත් ප්‍රමුඛත්වය හිමිවෙයි.
2. කම්කරු පංතියේත් අනෙකුත් නිර්ධන පීඩිත පන්ති කොටස්වලත් දේශපාලන ආධිපත්‍යයක් ගොඩනගා සියළු සමාජ අසාධාරණත්වයක් ද අසමානතා ද නැති කෙරේ.

### 19 වන සියවසේ යුරෝපයේ සමාජවාදී චින්තනය

3. නිෂ්පාදන බලවේගවල පොදු අයිතිය ඇති කොට නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කරමින් සූරාකෑම්වලින් තොර සාධාරණත්වයත් සමානාත්වයත් පදනම් කරගත් සමාජයක් ස්ථාපිත කෙරේ.

4. පන්ති කුල ගෝත්‍ර ජාති ආදි වශයෙන් සමාජයේ පවතින විෂමතා නැතිකොට සියළු දෙනා අතර සහෝදරත්වය රජයන උසස් මානව සමාජයක් ළගා කර ගැනේ

### සමාජවාදී අදහස් ඉදිරිපත්වීම පිළිබඳ ඓතිහාසික පසුබිම

- Robert Oven (1771-1858) විවේචනවලට සීමා නොවී පීඩිතයින් සඳහා වඩා යහපත් සමාජ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත්තේ මොහුය.
- ධනවාදය බලවත් සමාජ ප්‍රවාහයක් යුරෝපයේ සියළු රාජ්‍ය හරහා පැතිර යද්දී සමාජවාදය පුද්ගලික උනන්දුවීම් තුළින් ගුළු වශයෙන් කෙරෙන ප්‍රතිසංස්කරණ යටතේ උදාකර ගත හැක්කක් නොවන බව ද ඔහුට අවබෝධ විය.
- දේශපාලන ආර්ථික ආදි වශයෙන් කෙරෙන ව්‍යුහාත්මක පරිවර්තනයකින් තොරව සමාජවාදය උදා කර ගත හැකිය යන විශ්වාසය හුදු මනෝරාජික අදහසක් නැතහොත් සිහිනයක් පමණක් බව පසක් විය.

### සමාජවාදී අදහස් ඉදිරිපත්වීම පිළිබඳ ඓතිහාසික පසුබිම

- නූතන අවධියේ සමාජවාදය ප්‍රබල දේශපාලන චින්තනයක් වශයෙන් ඉදිරිපත්වීමට බලපෑ ප්‍රධාන පසුබිම සකස් කළේ 19 වන සි යවස වන විට යුරෝපයේ පැන නැගුණ කාර්මික විප්ලවය විසින් ඇති කරන ලද සමාජ ආර්ථික පරිවර්තනයයි.
- සමාජවාදී චින්තනය එක් එක් චින්තකයෙකු හෝ එක් චින්තන පරම්පරාවක් හෝ ඉදිරිපත් කළ එකක් නොව චින්තකයන් රාශියක් චින්තක පරම්පරා කීපයක් විසින් ඉදිරිපත් කරන ලද අදහස් සමුදායක පරිපූර්ණවීමක් ලෙස හැඳින්විය හැකිය.

### විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- දහනව වන සියවසේ සමාජවාදී චින්තනයේ දියුණුව සම්බන්ධයෙන් ඉමහත් සේවාවක් කළ වැදගත් චින්'කයින් දෙදෙනා වශයෙන් කාල් මාක්ස් ද ෆ්‍රෙඩ්රික් එංගල්ස් හැඳින්විය හැකිය.
- සමාජ සංවර්ධනයට අදාළ සාධක වඩා තාර්කික වුත් ගැඹුරුවුත් විග්‍රහයකට ලක් කරමින් සමාජවාදී චින්තනය විද්‍යාත්මක පදනමක් මත පිහිටා ඉදිරිපත් කිරීම මොවුන් අතින් සිදුවූ ප්‍රධාන සේවාව විය.
- සමාජවාදය බලපෑම් සහගත දේශපාලය ආර්ථික වැඩ පිළිවෙළක් වශයෙන් වැඩි දෙනාගේ සැලකිල්ල ඒ වෙත යොමු වන්නේ මොවුන්ගේ අදහස් සමගයි

### සමාජවාදී අදහස් ඉදිරිපත්වීම පිළිබඳ ඓතිහාසික පසුබිම

- මනෝරාජික සමාජවාදී චින්තනය
- යුරෝපයේ නූතන අවධියේදී සමාජවාදී අදහස් පළමුවෙන්ම ඉදිරිපත් කළ චින්තකයින් මනෝරාජික ලෙස සැලකේ.
- ධනේශ්වර සමාජ ක්‍රමයේ දුර්විපාක පළමුවෙන්ම ඉදිරිපත් කළේ මොවුන් ය.
- ඔසේ වුවත් වඩා යහපත් සමාජයක් කෙසේ ඇති කර ගන්නේද යන්න ගැන නිශ්චිත අදහසක් හෝ වැඩ පිළිවෙළක් නොමැතිවීම මොවුන්ගේ ප්‍රධාන අඩුපාඩුවක් විය.

### විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- ද්විඝටනාත්මක භෞතිකවාදය (අපෝහක භෞතිකවාදය නැතහොත් ද්වන්ද්වාත්මක භෞතිකවාදය)
- 19 න සියවස වන විට දර්ශනවාදීන් අතර පැවති ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ පුද්ගල ජීවිතය ඇතුළු සමස්ථ විශ්ව ක්‍රියාවලිය සම්බන්ධයෙන් වඩා වැදගත් භෞතික හෙවත් ද්‍රව්‍යාත්මක පදනම ද යන්නයි.
- ගමම කරුණ මූලික කරගෙන චින්තකයින් භෞතිකවාදීන් සහ විඥාණවාදීන් වශයෙන් කඳවුරු දෙකකට බෙදී ගියහ.

### විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- මාක්ස්වාදීන් කියා සිටියේ භෞතිකවාදය නැතහොත් ද්‍රව්‍යාත්මක පදනම සමස්ථ විශ්ව ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රධාන වන බවයි
- මේ හැර මේ අවධිය වන විට චින්තකයින්ගේ අවධානයට ලක්වූ තවත් අදහසක් වූයේ විශ්වයට අදාළ සියළු දේවල් වෙනස්වෙමින් වර්ධනය කරා යන මහා ගතික ක්‍රියාවලියකට සම්බන්ධව පවතින බවයි..

## විද්‍යාත්මක සමාජවාදී චින්තනය

පන්ති සටන සහ රාජ්‍ය පිළිබඳ න්‍යායය

විද්‍යාත්මක සමාජවාදීහු ආර්ථික සාධකවලට වෙනත් කිසිවෙකු ලබානොදුන් වැදගත්කමක් ලබාදුන්හ.

මොවුන්ට අනුව පුද්ගල ජීවිතයේ හැඩ රුව තීරණය කරන අති ප්‍රබල සාධකය වූයේ ආර්ථික යයි.

සෑම මිනිසෙකුම ආර්ථික මිනිසෙකුමෙන් සෑම සමාජ පන්තියක් ම ආර්ථික පන්තියක් ලෙස මොවුහු විස්තර කළහ.

අතීතයේ සිට සෑම අවධියකම නිෂ්පාදන බලවේගවල අයිතිය ලැබූ සහ එම අයිතිය අහිමි වූ වශයෙන් සමාජය තුළ ප්‍රධාන දෙපිරිසක් සිටි අතර මේ දෙපිරිස අතර ප්‍රබල ප්‍රතිවිරෝධයක් හෙවත් ගැටුමක් දක්නට ලැබුණු බව මාක්ස්වාදීහු විග්‍රහ කළහ.

### විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- **Hegal** (හේගල්) ට අනුව සෑම ඓතිහාසික ක්‍රියාවලියක්ම තමනට පටහැනි ප්‍රතිවිරුද්ධ බලවේගයක් නිර්මාණය කරයි. මේ බලවේග දෙක අතර ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් නව බලවේගයක උපත සිදුවන අතර එයද කලින් මෙන් යළිත් නවක බලවේගයක් උත්පාදනය කරයි. මේ එකිනෙකට පරස්පර බලවේග ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය විකාශය වෙයි.
- මේ අනුව ප්‍රතිවිරෝධය ගැටීම විනාශය වර්ධනය යන කාරණා ද්වන්දාත්මක මූලධර්මය යටතේ විශ්වයේ භෞතික ක්‍රියාවලිය තුළ දක්නට ලැබෙන ප්‍රධාන කරුණු ලෙස විස්තර කෙරුණි

## විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- ධනේශ්වර ක්‍රමය හා විප්ලවය
- වැඩවසම් සමාජයේ බිඳ වැටීමෙන් අනතුරුව බිහිවූ ධනේශ්වර සමාජ ක්‍රමය මාක්ස්වාදීන් විසින් ඉතා තියුණු විග්‍රහයකටද විවේචනයකටද ලක් කරන ලදී,
- 19 වන සියවසේ මැද භාගය වන විට යුරෝපයේ ධනපති ක්‍රමය වර්ධනය වූ එංගලන්තය ප්‍රංශය ජර්මනිය යන රටවල පැවති අර්බුදකාරී සමාජ වාතාවරණය විසින් මාක්ස්වාදීන්ට අවශ්‍ය ආදර්ශය ලබා දෙන ලදී .

## විද්‍යාත්මක සමාජවාදී චින්තනය

- ඓතිහාසික භෞතිකවාදය
- ද්විඝටනාත්මක පදනමක් මත පිහිටා සමාජ ඓතිහාසික පරිනාමය නැතහොත් මානව සමාජයේ ඉතිහාසය විග්‍රහ කිරීම පිළිබඳ මාක්ස්වාදීන්ගේ ක්‍රමය ඓතිහාසික භෞතිකවාදය වශයේන විස්තර කළ හැක.
- ඒ අනුව මානව සමාජයේ ආරම්භයේ සිට සමාජ පරිමානය තුළ ප්‍රධාන අවධි හෙවත් ආදී කල්පික කොමියුනිස්ට් සමාජ අවධිය වහල් සමාජ අවධිය වැඩවසම් සමාජ අවධිය ධනේශ්වර සමාජ අවධිය වෙයි